නව ව්‍යවස්ථාවක් වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු යෝජනාවලියේ ඇති පහත කරුණු කෙරෙහි අවධානය යොමුකරනු කැමැත්තෙමි.

## එය උපරිම බලය බෙදාහැරීමක් යෝජනා කරයි.

- බලය බෙදාහැරීමේ මූලධර්ම නම් දෙවන පරිච්ඡේදයේ දක්වා ඇති ප්‍රධාන නිර්දේශ දෙකින් එකක් වන්නේ අනුපූරකතාවය පිළිබඳ මූලධර්මය යනු යි. ඒ යටතේ දක්වා ඇති කරුණු පහත පරිදි ය.

    මෙහෙයුම් කමිටුව, අනු කමිටු සහ මහජන අදහසේ විමසීමේ කමිටුව යනාදියට විවිධ අවස්ථාවන්හි දී ඉදිරිපත් වූ අදහස්වල අනුපූරකතා මූලධර්මයට (එනම් පහළම ස්තරයෙන් කළ හැකි ඕනෑම දෙයක් එයට පැවරිය යුතු බවට) පොදු පිළිගැනීමක් තිබුණි.

    රජයේ ස්තර තුන අතර විෂයයන් හා කාර්යයන් වෙන් කිරීමේ දී ඒවා තීරණය කිරීමට මෙම මූලධර්මය මග පෙන්වීමක් විය යුතුය.

- බලය බෙදාහැරීමේ මූලධර්ම යටතේ ඇති අනෙක් ප්‍රධාන නිර්දේශය වන්නේ බලය බෙදාහැරීමේ මූලික ඒකකය පළාත විය යුතු ය යනු යි.

## මධ්‍යම රජයට පළාත් කෙරෙහි කළ හැක්කේ සීමිත බලපෑමකි.

- සමගාමී ලැයිස්තුව ඉවත් කළ යුතු බවටත් ජාතික ලැයිස්තුවක් හා පළාත් ලැයිස්තුවක් පමණක් තිබිය යුතු බවටත් යෝජනා කර ඇත. ජාතික ලැයිස්තුවට ඇතුලත් කිරීමට යෝජනා කර ඇත්තේ ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාවය, ජාතික ආරක්ෂාව හා ආර්ථික ඒකීයබව සහතික කිරීම සඳහා අවශ්‍ය විෂයන් පමණි. පළාත් ලැයිස්තුවේ විෂයන්ට ද ඇතුලු ව ජාතික ප්‍රමිති හා නීති නියම කිරීමේ බලයක් පමණක් මධ්‍යම රජයට ඇත.

- අධ්‍යාපනය, සංස්කෘතික කටයුතු, පරිපාලන කටයුතු වැනි අන් සියලුම අංශ කෙරෙහි මධ්‍යම රජයේ ජාතික ප්‍රමිතීන්ට යටත් ව පූර්ණ බලතල පළාත් රජයන්ට හිමිවන බව මේ අනුව නිගමනය කළ හැකි ය.

- ජාතික ප්‍රතිපත්ති මගින් පළාත් ලැයිස්තුවේ ඇති කාරණාවන් සම්බන්ධයෙන් පළාත් සභාව විසින් පනවන ලද ප්‍රඥප්ති උල්ලංඝනය නොවිය යුතු බව සඳහන් වේ.

- පළාත් ලැයිස්තුවේ සඳහන් විෂයන් සම්බන්ධ ව මධ්‍යම රජයට නීති පැනවිය හැක්කේ සියලුම පළාත් සභාවල එකගතාවය මත ය.

- ආණ්ඩුකාරවරයාට නිශ්චිත බලතල දී ඇතිවිට හැර අන් හැමවිටම ඔහු පළාත් අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත ක්‍රියාකළ යුතු බවට යෝජනා කර ඇත.

- ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකය විසින් තෝරාගැනීමටත් විධායක බලතලවලින් බහුතරයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ අග්‍රාමාත්‍යවරයා වෙතින් ක්‍රියාත්මක වීමටත් අරමුණු කරගත් යෝජනා ඇත.

- ව්‍යවස්ථාව සංශෝධනය කිරීම පාර්ලිමේන්තුවට තනිව කළ නොහැකි අතර ඒ සඳහා දෙවන මන්ත්‍රී මණ්ඩලයේ ද එය තුනෙන් දෙකකින් සම්මත විය යුතු ය. දෙවන මන්ත්‍රී මණ්ඩලයේ 55 න් 45 ක් ම පළාත් නියෝජිතයන් ය.

ඉහත යෝජනා දෙස මැදහත් සිතින් බලන බුද්ධිමත් පුරවැසියකුට පහත ගැටලු ඇතිවිය හැකි ය.

පළාත් බලතල මෙතරම් වැඩිකිරීමෙන් සහ මධ්‍යම රජයට පළාත් කෙරෙහි බලපෑම් කිරීමට ඉතා සීමිත ඉඩක් (එනම් අධ්‍යාපන, සෞඛය ආදි අංශයන් කෙරෙහි ජාතික මට්ටමේ නියමකිරීම් කිරීම සහ කැරලිකාරී අවස්ථාවක දී විසුරුවා හැරීම පමණක්) ලබාදීම විසින් සැලසෙන පරිපාලනමය හෝ වෙනයම් හෝ වාසියක් ඇත් ද?

- රටේ පරිපාලනය පහසුවීම හෝ පොදු ශ්‍රී ලාංකික හැඟීම ශක්තිමත් වීම සිදුවන්නේ ඒ ඒ පළාත් තුළ වෙන වෙන ම පොලිසි, විෂය නිර්දේශ වැනි දෑ සහ අනෙකුත් නීති පැවතීමෙන් ද නැතිනම් එකම තැනකින් මුලුරටටම ඒ සිදුවන විට ද? බලතල වැඩිකිරීමෙන් රට බෙදී වෙන් නොවුවත් ජනතාව බෙදී වෙන් විය හැකි ය. එනම් රට මනෝවිද්‍යාත්මක ව බෙදී යා හැකි ය. වෙන ම රාජ්‍යයක් නොවුනත් වෙන ම රාජ්‍යය හැඟීමක් ඇතිවිය හැකි ය.

- (ස්පාඤ්ඤය ඒකීය රාජ්‍යයක් වුවත් අධික ලෙස බලය විමධ්‍යගත කිරීම තුළ එහි කොටසක් වූ කැටලෝනියාව තමන් වෙන ම රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලදී)

බහුතරයක් පළාත් නියෝජිතයන්ගෙන් සමන්විත දෙවන මන්ත්‍රී මණ්ඩලයේ අනුමැතියෙන් තොර ව පාර්ලිමේන්තුවට තනි ව ව්‍යවස්ථාව සංශෝධනය කළ නොහැකි නම් එවිට පාර්ලිමේන්තුව සතු මුලුරටටම නීති පැනවීමේ බලය උල්ලංඝනය වේ. මෙය මේ යෝජනාවලියේ ම ඇතුළත් පහත කියුම සමග විමසා බලන්න.

> මෙම ව්‍යවස්ථාවේ ඒකීය රාජ්‍යය/ඔරුමිත්ත නාඩු යන්නෙන් අදහස් වන්නේ නොබෙදූ සහ බෙදිය නොහැකි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඕනෑම සංශෝධනයක් සඳහා හෝ එය පරිච්ඡින්න කොට ඒ වෙනුවට වෙනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැනවීම සඳහා වන බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති ආකාරයට පාර්ලිමේන්තුව සහ (අදාල වන තැන්හි) ශ්‍රී ලංකාවේ ජනතාව වෙත පවතිනු ඇති රාජ්‍යයක් වනු ඇත.

නමුත් මෙහි දී දෙවන මන්ත්‍රී මණ්ඩලය සමග පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ බලය බෙදා ගැනීමට සිදුවන්නේ නම් එම ව්‍යවස්ථාව ඔවුන් ම සපයන ඒකීය නිර්වචනය සමග ගැලපෙන්නේ ද?

එමෙන් ම දෙමල, මුස්ලිම් බහුතරයන් සහිත පලාත් තුළ සංහිදියාවට සහ පොදු ශ්‍රී ලාංකික හැඟීමට හානිකර ක්‍රියාකාරකම් (එනම් ප්‍රාදේශීය වර්ගවාදයන් ශක්තිමත් වීම) සිදුවීමට ඇති ඉඩ වැළැක්වීමට දක්වා ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් ද? වෙනත් ලෙසකින් කිවහොත් දෙමල, මුස්ලිම් බහුතර පලාත් තුළ ජාතිවාදී ව කටයුතු කිරීමේ හැකියාව (උතුරු පලාත් සභාවේ සම්මත වූ ඇතැම් යෝජනා සහ ආගමික ස්වභාවයෙන් ඔබ්බට ගිය මලවුන් සැමරීම්, බෞද්ධ පුදබිම්/පුරාවිද්‍යාත්මක ස්ථාන පැහැරගැනීමට තැත්කිරීම් වැනි ක්‍රියා) තවත් වැඩිවර්ධනය විය හැකි ය. එවිට එය ශ්‍රී ලාංකික හැඟීමට අහිතකර වනවා මෙන් ම දකුණේ ජාතිවාදීන්ටද රට ඇවිලවීමට හොඳ තල්ලුවක් වනු ඇත. එවැනි තත්ත්වයක් සාමයට හිතකර නොවේ. රට නිරන්තරව නොසන්සුන්කාරී තත්ත්වයක් ගත හැකි අතර ආගමික හා ජාතිවාදී ආතතීන් ප්‍රබල වනු ඇත. උද්ගත වී ඇති ඉස්ලාම් ත්‍රස්තවාදයත් සමග නැගෙනහිර පලාතට මෙවැනි බලයක් ලැබුණහොත් ඔවුන් සිය පලාත තුළ ෂරියා නීතිය මුලුමනින් ම ක්‍රියාත්මක කිරීමේ අවදානමක් ද ඇත.

අදටත් කාතිවරු කසපහර ක්‍රියාත්මක කරන (බලන්න – හසනා සේගු ඉසදීන් සහ හිෂානා හමීන් ලියූ unequal citizens පොතේඉංග්‍රීසි පිටපතේ 27-28 පිටු . පොත මෙතැන ඇත.https://mplreforms.com/unequal-citizens-study/) නැගෙනහිර, ත්‍රස්තවාදයට උපත දුන් කාත්තන්කුඩිය මේ බලයෙන් මොනවා නොකරනු ඇත් ද?

විසුරවා හැරීමට හා බලය පවරා ගැනීමය හැකි බව ඇත්තකි. එහෙත් හැමදාමත් එය සිදුකරමින් සිටිය හැක. අනෙක් මේ බලතල යොදාගනිමින් ත්‍රස්තවාදී කණ්ඩායම්වලට රහසිගත ව උපකාර කළ හැකි ය. පසුව එය එළිවී විසුරුවත් සිදු වූ එය දෙය (සහ ව්‍යවස්ථා සම්පාදනයේ දී ගිය නුවණ) යළි අද්දවා ගත නොහැකි වනු ඇත. නමුත් හානි සිදුවන්නට පසුබිම සකසා ප්‍රතිකාර කරමින් සිටිනවා වෙනුවට මුල දී ම එය වැළකෙන පරිදි බලය බෙදාහැරීම සුදුසු නොවේ ද?

- ජාතික ආරක්ෂාව හා භෞමික අඛණ්ඩතාවය රැකීමට අවශ්‍ය විෂයන් පමණක් මධ්‍යම රජය අත තබාගැනීමෙන් රටේ ආරක්ෂාව සහ එක්සත් බව තහවුරු කළ නොහැකි ය. නිදසුනක් ලෙස පලාත් රජයකට ආරක්ෂක බලතල ලැබීමට වඩා ඔවුන්ට පාසල් විෂය නිර්දේශයන් සැකසීමේ බලතල ලබා දීම භයානක විය හැකි ය. මන්ද යත් වර්ගවාදී, ආගම්වාදී අරමුණු උදෙසා ඉතිහාසය, ආගම වැනි විෂයන් යොදාගත හැකි බැවිනි. ආරක්ෂක බලතල තුළින් කැරැල්ලක් ගැසීමට පමණක් හැකි නමුත් දිගින් දිගට ම කැරලි ගසන පරපුරක් බිහිකිරීමට මෙවැන්නකින් හැකිවනු ඇත. නිදසුනක් ලෙස උතුරු පලාතේ ඉතිහාස නිර්දේශයකට දෙමල ජනතාවගේ සන්නද්ධ අරගල ඉතිහාසය ගැන ශ්‍රී ලංකා රජය හා හමුදා ගැන ඔවුන්ගේ විග්‍රහයන් (ආක්‍රමණයක්, ස්වයං පාලන අයිතිය උදුරා ගැනීමක්) ඇතුළත් කළ හැකි ය. නැතිනම් නැගෙනහිර පලාතේ විෂය නිර්දේශයකට අන්තවාදී ඉස්ලාමීය දෘෂ්ටිවාදයන් එබ්බවිය හැකි ය.

- ගැටලුව ඇත්තේ වැරදීමකින් හෝ එවැන්නක් සිදුවුවහොත් එය පරීක්ෂා කිරීමට හෝ වැළැක්වීමට බලතල මධ්‍යම රජය සතු නො වීම යි. (කැරලිකාරී තත්වයක දී පලාත් විසුරුවීමේ බලයක් ජනපති/අගමැතිට ඇතත් එය අධිකරණයේ පරීක්ෂාවට ලක්වන

බැවින් මෙවැන්නක් කැරලිකාරී තත්ත්වයක් ලෙස අර්ථදැක්විය හැකි ද යන්න ද ගැටලුවකි) විෂය නිර්දේශ සම්බන්ධ කරුණුවල දී පමණක් නොව අනෙකුත් අංශයන්හි දී ද මෙවැනි තත්ත්වයන් ඇතිවිය හැකි ය.

එමෙන් ම ජනාධිවරයා වෙනුවට අගමැතිට වැදගත් විධායක බලතල පැවරීම ද ප්‍රශ්නසහගත වන්නේ ජනපතිවරයා මෙන් නොව අගමැතිවරයා පාර්ලිමේන්තු බහුතරය මත (විශේෂයෙන් ම සුලුජන පක්ෂවලට) වෙනස් කරගැනීමට ඇති හැකියාව නිසා ය. අන්තවාදී සුලුජාතිවාදී මත දරන පුද්ගලයකුට එම තනතුර ගැනීමට වෙස්ට්මිනිස්ටර් ක්‍රමය තුළ ලැබෙන ඉඩ සමස්ත ජනතාවගේම ඡන්දයෙන් පත්වන ජනපතිවරයකු සම්බන්ධයෙන් නැත. සමහරුන් තර්ක කරන්නේ 1978 ව්‍යවස්ථාවට පෙර ලංකාවේ පැවතුණේ ද විධායක අගමැති ක්‍රමය නිසා මෙය නැවත ඇතිකිරීම ගැටලුවක් විය නොහැකි බව ය. නමුත් ඔවුන් අමතක කරන හෝ සඟවන දෙය වන්නේ එකල පළාත්සභා හෝ මෙවැනි අධිබලතල සහිත පළාත්සභා හෝ නොතිබුණ බවයි. 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ තීන්දුවේ දී ෂර්වානන්ද විනිසුරු කියාසිටියේ එම සංශෝධනය මගින් ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයේ සීමාව දක්වා ගෙනගිය බවත් විධායක ජනපති ධුරය හේතුවෙන් ලංකාව ෆෙඩරල් රාජ්‍යයක් වීමෙන් වැළකුණ බවත් ය.

- මෙය බිල්ලන් මවාපෑමක් හෝ හැමදෙයකම සිදුවිය හැකි නරක දැකීමක් හෝ නොවන්නේ රටක නීතිය තුළ ඇතිවිය හැකි සෑම අහිතකර දෙයක් ම වැළැක්වීමට ප්‍රතිපාදන තිබිය යුතු බැවිනි. මිනිසුන් යහපත්ව හැසිරෙනු ඇත යන උපකල්පනයේ පිහිටන්නේ නම් අපට නීතියක් අවශ්‍ය නොවේ.

මීට අමතරව තවත් ප්‍රශ්නකාරී යෝජනා කිහිපයක් ම අඩංගු වේ.

ඒකීයභාවය හැඳින්වීමට දැනට භාවිතා වන වචන වෙනුවට නව වචන භාවිත කිරීමට හේතුව ලෙස දක්වා ඇත්තේ එම වචනවල සාම්ප්‍රදායික අරුත වෙනස් වී ඇති බවත් ඒකීය යැයි පැවසුණු රාජ්‍යයන් මෙන් ශ්‍රී ලංකාවද බෙදී යාමට එම වචනවල අර්ථය වෙනස් වීම බලපෑ හැකි බවත් ය. නමුත් අපට පෙනෙන පරිදි රටක් බෙදී යාමට බලපෑ හැක්කේ භාවිත වන වචනයේ අර්ථය නොව ජාතිවාදී හැඟීම්, මහජාතික පීඩනයන් සහ අවිචාරවත් බලය බෙදීම් ය.

මේ සියල්ල අතරේ අගය කළ යුතු යෝජනාවක් ද ඇත.

වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවතින නමවන ව්‍යවස්ථාව වෙනුවට පහත විකල්ප සූත්‍රණය යෝජනා කර ඇත.

> ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් සියලු ආගම් හා විශ්වාසයන්ට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකමින් හා වෙන්කොට සැලකීමකින් තොර ව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලු ම පුද්ගලයන්ට සහතික කරමින්, බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය.

මෙම වගන්තිය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය යන්න හෝ බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කළ යුතු ය යන්න හෝ ඉවත් කර හෝ වෙනස් කර නැත. නමුත් ඒ වෙනුවට ඔවුන් අන් ආගම්වල අයිතිවාසිකම්ද ආරක්ෂා විය යුතු බව පවසන වැකියට, සියලු ආගම් ආගම් හා විශ්වාසයන්ට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකමින් හා වෙන්කොට සැලකීමකින් තොර ව යනුවෙන් එකතු කිරීමක් කරයි.

මෙම භාෂාත්මක වෙනස තුළින් සහෝදර ආගම් කෙරෙහි වැඩි සුරක්ෂිතතාවයක් සහ අභිමානයක් ඇති කිරීමට දරා ඇති උත්සාහය අප අගය කළ යුතු ය. කෙසේනමුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාවේ විවාදයන් තුළ මෙම යෝජනාවද ඇතුලු ව සමස්ත යෝජනාවලියට ම විරෝධතා එල්ල විය. අන් ආගම්වලට ගෞරවයෙන් හා අභිමානයෙන් සැලකීමට විරුද්ධ වන්නන් බෞද්ධයන් නම් විය නොහැකි ය.

පසුකලක දී පාර්ලිමේන්තු වෙබ් අඩවියේ උඩුගත කර තිබූ ව්‍යවස්ථා කෙටුම්පතක් යැයි පෙනෙන (එනමුත් එ.ජා.ප. මන්ත්‍රීවරුන්ට අනුව සම්මතකරවාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා නොව ආතල් එක සඳහා පමණක් ලියන ලද) අද්භූත ලියවිල්ල කියවීමේ දී ඉහත ප්‍රශ්න කිරීමට ලක් වී තිබෙන මෙහෙයුම් කමිටු යෝජනාවන් කිසිවක් නොසලකා හැර නොතිබුණු බවත් එම යෝජනාවන්ට අනුකූල ව එහි ද 11, 12, 13 සහ උක්ත කරුණු ඇසුරු කරන අනෙකුත් පරිච්ඡේදවල විධිවිධාන සකස් වී තිබුණු බවත් පෙනී යන ලදී. කෙසේනමුත් එම නිකරුණේ ලියූ ලියවිල්ල (මට අනුව අනාගත කෙටුම්පත) තුළ ඉතාමත් දියුණු සහ පුලුල් මූලික අයිතීන් ප්‍රමාණයක් ආවරණය වන අතර එය ඇඩි සේ අගය කළ යුතු ය. කර තිබූ එකම වෙනස වූයේ සමගාමී ලැයිස්තුවක් එක්කිරීම පමණකි.

මේ සටහන තබන මා ළමාවියේ පටන් අගය කළ දේශපාලන වීරයා වූයේ වික්‍රමබාහු කරුණාරත්න ය. ඔහු දෙමළ ජනතාවට ස්වයං පාලන බලතල ලබාදීමට ඇඩි ව පෙනී සිටි අයෙකි. දීප්ති කුමාර ගුණරත්න සිය දේශනයක දී උතුරු පලාත තුළ ජනමත විචාරණයක් පවත්වා එය වෙන ම රාජ්‍යයක් වන්නේ ද නොවන්නේ දැයි තීරණය කළ යුතු බව පැවසූ දින පටන් මා දැරුවේ එම මතයයි. මා දැරූ එම සාම්ප්‍රදායික මාක්ස්වාදී මතය වෙනස් වීමට බල පෑ ප්‍රධාන කරුණක් වූයේ මෑතක පටන් සාමාන්‍ය දමිල ජනතාව නිජබිම්වාදී දේශපාලනයෙන් දුරස් වෙමින් තිබීම ය. ඔවුන් තුළ වෙන්වීමේ වුවමනාවක් නැතිවිට අපි කුමට ඊට උඩගෙඩි දෙමු ද? උතුරු පලාතේ සේවය කළ හමුදා නිළධාරියකු වෙන් ව යනවිට කඳුළු සලමින්, මල්මාලා දමමින් ඔවුන් පෙන්නුම් කළේ එයයි. ගංවතුර උවදුර තුළ හමුදාවගේ සේවය අගය කරමින් ඔවුන් දැක් වූ අදහස් තුළ පිළිබිඹු වූයේ ද එයයි. ලෙනින් කීවේ තමන් සුලුජාතීන්ට ස්වයංපාලන බලතල දීමට යෝජනා කරන්නේ පෝලන්තයේ සංස්කෘතික තත්ත්වයන් අනුව පමණක් බවත් වෙනත් රටක සංස්කෘතික තත්ත්වයන් මත එය වෙනස් විය යුතු බවත් ය. නමුත් ලංකාවේ පැරණි වමේ වියතුන් බොහොමයක් ලංකාවේ සංස්කෘතික තත්ත්වයන් නොතකමින් එම පැරණි මාක්ස්වාදී මතයේ එල්බ ඇත. ලාල් විජේනායක සහ ජයම්පති වික්‍රමරත්න යනු ලංකාවේ සමසමාජ පක්ෂයෙන් බිඳී ගිය බහුතර කණ්ඩායමේ පිරිස් ය. ඔහු ද එම ස්වයං තීරණ අයිතිය පිළිබඳ ලෙනින්ගේ අදහස අවිචාරවත්ව යොදන්නෝ ය. පාර්ලිමේන්තු වෙබ් අඩවියේ ඇති

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ස්වරූපයෙන් ලියා ඇති අද්භූත ලියවිල්ල (එය අද්භූත වන්නේ එය එය ආදර්ශ ව්‍යවස්ථාවක් නොවන බව සමහර එජාප දේශපාලකයන් පැවසීම නිසා ය.) කියවීමේ දී මට පෙනී ගිය දෙයක් වන්නේ එය සැකසීමේ දී එයට පාදක වූ මෙහෙයුම් කමිටු යෝජනාවලියට ශ්‍රී.ල.නි.ප. සහ හෙල උරුමය විසින් කරන ලද කිසිදු වෙනස්කමක් සැලකිල්ලකට නොගෙන ඇති බවත් ය. මේ අනුව එම ආදර්ශ ව්‍යවස්ථාව ද ඒ ආකාරයෙන් ම එයට යෝජනා කර ඇති සංශෝධනයන් බැහැර කරමින් අන්තනෝමතික ව සම්මත කරගැනීමට ඉඩ ඇත. මෙය හුදෙක් යෝජනාවක් නිසා කළබළ නොවන්නැයි පවසන එජාප දේශපාලකයන්ට අපට කීමට ඇත්තේ ඔබේ යෝජනා, යෝජනා නොවන බව අපි දනිමු කියා ය.